# මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ වූ කොළඹ ප්‍රකාශය

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

### හැඳින්වීම

අදහස් ප්‍රකාශ කිරීමේ සහ මාධ්‍ය නිදහසේ ප්‍රගතියට සමගිය සහ සහයෝගය සඳහා වූ වගකීම නැවත අවධාරණය කිරීමක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා පුවත්පත් කර්තෘන්ගේ සංසදය සහ පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය විසින් මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ වූ කොළඹ ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය මෙම සාකච්ඡාවට සහභාගි වූ අතර විධායක කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රකාශයට අත්සන් තබන බව දන්වා ඇත.

කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 1998 අප්‍රේල් 27 සිට 29 දක්වා පැවැත් වූ මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ වූ සම්මන්ත්‍රණය අවසානයේ ප්‍රකාශය ඉදිරිපත් කෙරිණි. ඉහත සඳහන් වූ සංවිධාන සමඟ ලෝක පුවත්පත් සංගමය හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙය සංවිධානය කළේය. සම්මන්ත්‍රණයේදී අභ්‍යන්තර අර්බුද වාර්තාකරණය සාපරාධ අපහාසය හා විද්‍යුත් මාධ්‍යන්ගේ නැඹුරුතාවන් ගැන සලකා බලන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය ඉතිහාසයේ කර්තෘන්, ප්‍රකාශකයන්, මාධ්‍යවේදීන්, මානව හිමිකම් ක්‍රියාකාරීන් හා උගතුන් මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කිරීමට එකම ස්ථානයකට රැස්වී පොදු තලයක ප්‍රතිසංස්කරණයන් ගැන එකඟතාවකට පැමිණි ප්‍රථම අවස්ථාව මෙය විය.

නියෝජ්‍ය මාධ්‍ය ඇමති අනුර ප්‍රියදර්ශන යාපා මහතා සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සමාරම්භක සැසිය ඇමතූහ. මූලික කථාව පැවැත්වූ දක්ෂිණ අප්‍රිකානු මාධ්‍ය ආයතනයේ විධායක අධ්‍යක්ෂිකා ජිනට් මිනි, මාධ්‍යවේදීන් සුරකීමේ කමිටුවේ ආසියානු වැඩසටහන් සම්බන්ධීකාරක ලින් නිවුමාන්, 'ආටිකල් 19හි' එලිසබත් නිසාන්, ලෝක පුවත්පත් නිදහස කමිටුවේ සභාපති කශ්රොව් ඉරානි, පොදු රාජ්‍ය මණ්ඩලීය පුවත්පත් සංගමයේ ලින්ඩ්සි රෝස්, ඉන්දියාවේ ප්‍රසාභාරති පුවත්පත් අධ්‍යක්ෂ ජෝර්ජ් වර්ගීස් සම්මන්ත්‍රණයට සහභාගී වූ විදේශ නියෝජිතයෝ වූහ. එම විදේශ නියෝජිතයෝ මාධ්‍යයන්ට සම්බන්ධ නීතිමය හා ව්‍යවස්ථාමය රාමුව පිළිබඳ වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවද හමු වූහ.

### මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ වූ කොළඹ ප්‍රකාශය

### පූර්විකාව

#### මෙම ප්‍රකාශය සැකසූවෝ

❺ අදහස් ප්‍රකාශ කිරීමේ සහ තොරතුරු ලබාගැනීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ප්‍රගතිය හා ශුභසාධනය මෙන් ම අනෙක් මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා

අත්‍යවශ්‍ය බව තරයේ විශ්වාස කරමින්

- ❺ මහජනතාවට තමන් පත් කළ රජයේ ක්‍රියාකාරකම් විමර්ශනය කිරීමට, දේශපාලනික දැනුවත් බව ලබා ගැනීමට හා ප්‍රජාතන්ත්‍රික සමාජයක පූර්ණ හවුල් කරුවන් වීමට තොරතුරු ලබාගැනීමේ
  ඉඩකඩ තිබීම අත්‍යවශ්‍ය බව සිත්හි තබා ගනිමින්
- ❺ ඉහත සඳහන් මූලධර්ම පහසුවෙන් සාක්ෂාත් කිරිම සඳහා ජනමාධ්‍යවේදියා සමාජයේ තීරණාත්මක කාර්යභාරයක් ඉෂ්ට කරන බව අවබෝධ කරගනිමින්
- ❺ සිය නිලයෙහි ස්වභාවය හේතුවෙන් රාජ්‍ය නිලධරයන් හුදු සාමාන්‍ය පුද්ගලයනට වඩා තියුණු මට්ටමෙහි විවේචන ඉවැසිය යුතු බව සැලකිල්ලට ගනිමින්
- ❺ මහජනතාවට අදාළ පොදු කරුණු පිළිබඳ සංවාද, අසම්බාධකව ද ශක්තිමත්ව ද සිදුවිය යුතු බවත් නිදහස් සංවාදවලදී සමහර සාවද්‍ය ප්‍රකාශ ඇතිවීම නොවැලැක්විය හැකි බවත් ඒත්තු ගන්වමින්, රාජ්‍ය ක්‍රියාකාරකම් විවේචනය කරන්නත් තමන් සත්‍ය යැයි විශ්වාස කරන විවේචන පවා සැබවින්ම අසත්‍ය වන්නේ වූවත් ප්‍රකාශ කිරීමට වර්තමාන සාපරාධ අපහාස නීතිය නිසා බියපත් ව පැකිලීමෙන් මහජන සංවාද පිණිස ඇති අවස්ථාවෙහි ජවය හා සීමාව හීන වන බැවින් ඔවුන් හට නෛතික ආරක්ෂාව දීමෙහි අවශ්‍යතාවය වටහා ගනිමින්
- ❺ බොහෝ විට වාරණය භාවිත කෙරෙන්නේ හිතුවක්කාර සහ අක්‍රමික ලෙසත් මහජනතාවට තොරතුරු දැනගැනීමට ඇති අයිතියට සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට එරෙහි බව අවබෝධ කරගනිමින්
- ❺ තමන්ගේ වෘත්තීය කාර්යයන් ඉටු කිරීමට බාධා පැමිණෙන ආකාරයේ බය ගැන්වීම් වලට හා තර්ජනය කිරිම්වලට ජනාමධ්‍යවේදීන් ලක්වීම පිළිබඳ උනන්දුවෙන් සැලකිලිමත් වෙමින්
- ❺ ජාතික ආරක්ෂාව හේතුවෙන්, අදහස් ප්‍රකාශ කිරීමේ සහ තොරතුරු දැනගැනීමේ නිදහසට සීමා පැනවිය හැක්කේ සීමාසහිත අවකාශයෙක බවට පැහැදිලි අවබෝධයක් වර්ධනය කිරීමේ අභිප්‍රායෙන් සතෝක්ත නිදහස භුක්ති විඳීමෙහි ලා අයුක්ති සහගත සීමා පැනවීමට රජය විසින් ජාතික ආරක්ෂව නැමැති ව්‍යාජ හේතුව භාවිත කරනු ලැබීම අධෛර්යවත් කිරීමට කටයුතු කරමින්

පහත සඳහන් යෝජනා පිළිබඳ එකඟතාවක් ඇතිකොටගෙන ඒවා ඔහු ප්‍රචාරයට පත් කිරීම, පිළිගැනිම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනවලට යෝජනා කරති.

## 1. ව්‍යවස්ථාමය නියෝග

1.1 අදහස් ප්‍රකාශ කිරිමේ නිදහස පිළිබඳ ව්‍යවස්ථාමය සහතිකවීම්

1.1.1. ශ්‍රී ලංකාවේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ ව්‍යවස්ථාමය සහතිකවීම් මෙරටෙහි ජාත්‍යන්තර නෛතික බැඳීම්වලට හා විශේෂයෙන් ම 1980 දී ශ්‍රී ලංකාව සම්මත කළ ජාත්‍යන්තර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිඥවට (ICCPR) අනුකූල විය යුතු ය.

1.1.2. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ව්‍යවස්ථාවේ නිගමන සහ තොරතුරු නිර්වචනය කිරීමට

ICCPR උපවගන්ති 19 (1), 19 (2) හී සඳහන් පරිදි, වඩා උචිත වචන මාලාවක් අවශ්‍ය ය.

ICCPR හි 19 වන වගන්තිය

1. (අන්‍යයන් ගේ) මැදිහත්වීමෙන් තොරව මත දැරීමේ අයිතිය ඕනෑ ම පුද්ගලයකු සතු වේ.

2. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සැමදෙනා සතු වේ. වාචික ව හෝ ලිඛිතව හෝ මුද්‍රිත ව හෝ කලා මාධ්‍යයෙකින් හෝ වෙනත් කවර මාධ්‍යයෙකින් හෝ මායිම්වලින් තොර වූ ඕනෑ ම ආකාරයක තොරතුරු සහ අදහස් සොයාගැනීමේ, ලබාගැනීමේ සහ ව්‍යාප්ත කිරීමේ නිදහස මෙහි අන්තර් ගත වේ.

1997 ඔක්තෝබරයේ ව්‍යවස්ථාමය සංශෝධන පිළිබඳ කෙටුම්පතෙහි ICCPR හි 19 (1,2) උපවගන්තිට
අනුකූල වන පරිදි 16 (1) උපවගන්තිය විස්තෘත සකස් කර ඇත. එසේ වුව ද ඉහත ඡේදයේ යටින් ඉරි ගසා ඇති අවශ්‍යාංග මෙම කෙටුම් පතෙහි අඩංගු නොවන බැවින්, අදහස් හා මතවාදයන් ප්‍රකාශ කිරීමේ හා තොරතුරු ලබා ගැනීමේ සහ ව්‍යාප්ත කිරීමේ අයිතීන් සුරැකීම සඳහා මෙම අවශ්‍යාංග එම වගන්තියට එකතු කරන ලෙස යෝජනා කරමු.

1.1.3. මෙම අයිතිය සවිස්තර ලෙස පැහැදිලි කරන ව්‍යවස්ථාදායක සහ අධිකරණ ඇමතිගේ කෙටුම්පත් ව්‍යවස්ථාවෙහි (නොවැම්බර 22, 1995) මෙයට අදාළ කොටස් ව්‍යවස්ථාවේ අඩංගු කළ යුතුය.

"මේ අයිතියට වාචික ව, ලිඛිත ව, මුද්‍රිත ව, කලා මාධ්‍යයකින් හෝ යමකු තෝරාගන්නා වෙනත් මාධ්‍යයෙකින් හෝ තොරතුරු හා අදහස් ගවේශනයෙහි, ලබාගැනීමෙහි හා පැතිරවීමේ නිදහස ඇතුළත් ය. මුද්‍රණ ද්‍රව්‍ය, රේඩියෝ විකාශන තරංග හෝ තොරතුරු ප්‍රචාරයෙහි යොදාගන්නා මෙවලම් හෝ උපකරණ හෝ රාජ්‍ය අංශයෙන් හෝ පෞද්ගලික අංශයෙන් හෝ නොනිසි ලෙස පාලනය කරනු ලැබීම වැනි වක්‍ර වලින් හෝ විධිවලින් හෝ නැතහොත් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමා කිරීමට ඉඩක් නොමැත."

1.2 මූලික අයිතිවාසිකම් පිළිබඳ ව්‍යවස්ථාමය සීමා

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ පුළුල් ලිබරල්වාදී ව්‍යවස්ථාදායක නියමයක් මඟින් විධායකයට පහසුවෙන් මෙම නිදහස සීමා කිරීමට හැකි වන හෙයින් එවැන්නක් නිර්ථක වෙයි. ඒ බැවින්,

අ) එම සීමා කිරීම් මහජන ගරුත්වය, සමානාත්මතාව සහ නිදහස මත ගොඩනැගුණ විවෘත, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාධාරණීකරණය කළ හැකි යුක්තිසහගත ආවශ්‍යක සීමාවන් බවට පත් කොට ඇති දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාවේ 36 (1) වගන්තියට සමාන වගන්තියක් අප ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.

(දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාව) අයිතිවාසිකම් පණතෙහි අඩංගු අයිතිවාසිකම් සීමා කළ හැක්කේ සාමාන්‍ය භාවිත නීතියට අනුකූල වන පරිදි සහ එම සීමා කිරීම් මනුෂ්‍ය ගරුත්වය, සමානාත්මතාව සහ නිදහස මත පදනම් වූ විවෘත සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යුක්ති සහගත සහ සාධාරනීකරණය කළ හැකි තෙක් පමණි. මෙහි දී සැලකිය යුතු කරුණු නම්

(ආ)එම අයිතිවාසිකමේ ස්වභාවය ආ) එම සීමාව පැනවීමට හේතුවන අරමුණෙහි ඇති වැදගත්කම ඇ) එම සීමා කිරීමේ ස්වභාවය සහ එය කොතෙක් දුරට ද යන්න ඈ) එම සීමා කිරීම සහ සීමා කිරීමෙහි අරමුණ අතර ඇති කාල පරිච්ඡේදය සහ ඉ) එම අරමුණ ඉටු කිරීමට යොදා ගතහැකි වඩා අඩු සීමා සහිත විධික්‍රම.

හෝ

ආ) රජය විසින් මූලික අයිතිවාසිකම් කෙරෙහි පනවන සීමා කිරීම් ICCPR 19 (3) උපවගන්තියෙන් ඉඩ ලැබෙන දුරට පමණක් කිරීම.

ICCPR ප්‍රකාශයේ 19 (3) වැනි උපවගන්තිය ඃ

අ) අන්‍යයන්ගේ අයිතිවාසිකම්වල හෝ කීර්තියේ හෝ ගරුත්වය සඳහා

ආ) ජාතික ආරක්ෂාව, මහජන විනය, මහජන සෞඛ්‍යය සහ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා

1.3 පාර්ලිමේන්තු වරප්‍රසාද

ව්‍යවස්ථා නියමයන්හි හා 1997 ව්‍යවස්ථා කෙටුම්පත්වල ද පාර්ලිමේන්තු වරප්‍රසාද පනතට සම්බන්ධව ඇත්තා වූද ICCPR හි 19 වන වගන්තියේ මූලධර්ම උල්ලංඝනය කරන්නා වූද සීමා කිරීම් ඉවත් කළ යුතු ය.

1.4 හදිසි නීතිය යටතේ මූලික අයිතිවාසිකම් අගය පහත හෙළීම

අවශ්‍ය විටෙක ශ්‍රී ලංකාවේ සන්දර්භයට ගැලපෙන සේ නවීකරණය කරන ලද ICCPR හි 4 වන වගන්තියෙන් සලසා ඇති යුක්තිය ඉටුකර ගැනීම පිණිස අධිකරණයට ප්‍රවේශ වීමට පුරවැසියනට ඇති අයිතිය දක්වා පමණක් හදිසි නීති සමයෙක දී මූලික අයිතිවාසිකම් සීමා කළ යුතුය. එනම්

ඇ) මෙම සීමාවන් ජාතිය, වර්ණය, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම හෝ සමාජ පසුබිම මත පදනම් වූ වෙනස් ලෙස සැලකීම් හා සම්බන්ධ නොවිය යුතුය.

ඈ) ICCPR හි වගන්ති 6,7,8 (පරිච්ඡේද 1 සහ 2) 11, 15, 16 සහ 18 යටතේ නිශ්චිතව විශේෂිකෘත අයිතිවාසිකම්හි අගය කිසි ම තත්ත්වයක් යටතේ පහත හෙළිය නොහැකි ය.

අ) මෙම සීමාවන් පැනවිය යුත්තේ නිල වශයෙන් ප්‍රකාශ කරන ලද දේශයේ පැවැත්මට තර්ජනයක් වන හදිසි අවස්ථාවල දී පමණ ය.

ආ) මෙම සීමාවන් පැනවිය යුත්තේ එම අවස්ථාවේ හදිසි අවශයතාවලට අත්‍යවශ්‍ය ම වන දුරට පමණක් වන අතර මෙම මානකයන් අන්‍ය ජාත්‍යන්තර නෛතික බැඳීම්වලට පටහැනි විය නොහැකි ය.

6 වන වගන්තිය - සෑම පුද්ගලයෙකුගේ ම ජීවත්වීමට ඇති නෛසර්ගික අයිතිය ආරක්ෂා කරයි. මරන දණ්ඩන පිළිබඳ නියම ද අඩංගු ය.

7 වන වගන්තිය - මෙහි සඳහන් වන පරිදි "කිසි ම කෙනෙකු වධයට හෝ කෲරත්වයට හෝ අමානුෂික හෝ ආත්මගෞරවය කෙලෙසන හෝ ක්‍රියාවන්ට හෝ දණ්ඩනයට හෝ භාජනය නොවිය යුතු ය. විශේෂයෙන් ම තමන්ගේ අනුමැතිය නොමැති ව වෛද්‍ය හෝ විද්‍යාත්මක හෝ පරීක්ෂණවලට භාජනය නොකළ යුතු ය."

8 වන වගන්තිය - මෙහි සඳහන් වන පරිදි "කිසි ම කෙනෙකු වහල් සේවයේ යොදා නොගත

යුතු අතර වහල් සේවය සහ වහල් වෙළෙඳාම එහි සෑම ස්වරූපයකින් ම තහනම් වනු ඇත."

11 වන වගන්තිය - මෙහි සඳහන් වන පරිදි "කිසිම කෙනෙකුට ගිවිසගත් වගකීමක් සාර්ථකව ඉටුකිරීමට නොහැකි වූ හේතුවෙන් ම හිර දණ්ඩනය නොපැනවිය යුතු ය."

15 වන වගන්තිය - මෙහි සඳහන් පරිදි කවර කියාවක් හෝ නොකැරහැරීමක් හෝ එය සිදු කරන කාලයේ දී බරපතල අපරාධයක් ලෙස ජාතික හෝ ජාත්‍යන්තර හෝ නීතිය යටතේ නොසැලකිණි නම් (එය සිදු කළ) කවරකු වුව ද බරපතළ අපරාධයකට වරදකරුවකු කිරීම හෝ අදාළ වරදට අදාළ කාලයේ පනවා ඇති දඬුවමට වැඩි දඬුවමක් පැනවීම හෝ නොකළ යුතු ය."

16 වන වගන්තිය - මෙහි සඳහන් වන පරිදි "නීතිය ඉදිරියේ සෑම කෙනෙකුට ම සෑම විට ම පුද්ගලයකු ලෙස පිළිගනු ලැබීමේ අයිතිය ඇත."

18 වන වගන්තිය - මෙහි සඳහන් වන පරිදි "සෑම කෙනෙකුට ම සිතීමේ, හෘදය සාක්ෂ්‍යයට අනුව ක්‍රියා කිරීමේ සහ ආගම ඇදහීමේ නිදහස ඇත.

1997 ඔක්තෝබරයේ ප්‍රකාශ කරන ලද ව්‍යවස්ථානුකූල කෙටුම්පතෙහි උපවගන්තිය 27 (1) හි ICCPR ප්‍රතිඥාවේ 2-4 වගන්තිවල අඩංගු අවශ්‍යාංග සම්පූර්ණ වේ. එහෙත් මෙහි අඩුපාඩුවක් වන්නේ හදිසි තත්ත්වයක් යන්න දේශයේ පැවත්මට තර්ජනයක් වන තත්ත්වයක් ලෙස විශේෂකරණයකට සීමා කර නොතිබීමයි.

### 1.5 නීති පැනවීමේ ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ වූ අධිකරණ විමර්ශන

ව්‍යවස්ථාවට අනුකූල වන හේතුව නිසා පවතින හා අනාගත හෝ නීති පැනවීමේ ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ වූ අධිකරණ විමර්ශන පැවැත්වීමට ව්‍යවස්ථාව සුළු සංශෝධනයකට ලක් කල යුතු අතර පනවා ඇති නීති පිළිබඳ ව අධිකරණ විමර්ශන පැවැත්වීමට කාල සීමා නොතිබිය යුතු ය. මෙම කාර්යය ඉටු කිරීම සඳහා ව්‍යවස්ථාවේ උප වගන්තිය 16 (1) අහෝසි කළ යුතු වේ.

ව්‍යවස්තාවේ උපවගන්තිය 16 (1) - "සියලු දනට පතින ලිඛිත සහ අලිඛිත නීතිය මින් මතු මෙම පරිච්ඡේදයේ ඇති නියමයනට අනුකූල වූව ද, වලංගු සහ ක්‍රියාත්මක වේ."

මෙම වගන්තිය සහ 1997 ඔක්තෝබර් කෙටුම්පතේ එහි ප්‍රතිනිෂ්පාදනය ව්‍යවස්ථාමය නීතියේ මූලික ප්‍රතිපත්තියක් උල්ලංඝනය කරන බැවින් එය අහෝසි කළ යුතු වේ. මෙම විශේෂ නියමය අන් ව්‍යවස්ථානුකූල වූ ප්‍රජාතන්ත්‍රික රාජ්‍යයන්හී දක්නට නො ලැබේ.

## 2. පුවත්පත් සහ මුද්‍රණ නීති

2.1 නිල රහස් යන්න පුළුල් සහ අනියමිත ලෙස නිර්වචනය කර ඇති නිල රහස් පනත අහෝසි කර, ඒ වෙනුවට තොරතුරු හෙළිදරව් කිරීම සාමාන්‍ය කාරනයක් සහ රහසිගත භාවය ව්‍යතිරේකයක් ලෙස සලකන්නා වූ තොරතුරු නිදහස පිළිබඳ පනත පැනවිය යුතු ය.

2.2. තොරතුරු නිදහස පිළිබඳ පනතින් විනිවිදභාවය සහ විවෘත රාජ්‍ය තන්ත්‍රයෙක මූලධර්ම පිළිබිඹු විය යුතු ය. මෙ බඳු නීතියක් මඟින් රහසිගතභාවය පිළිබඳ කාලසීමාව හැඟවීමට නොහැකි තොරතුරු වර්ගයන් විශේෂ ලෙස ලැයිස්තුගත කළ යුතුය. ස්වාධීන ආයතනයකට අභියාචනා කිරීමේ හැකියාව සපයා දෙන නියමයන් සහිතව ප්‍රවේශයන් වලංගු කිරීම සඳහා නීති නියමයන් ඇති කළ යුතුය. එහෙයින් මෙම නීතිය යටතේ ව්‍යතිරේක අංග වන වෛද්‍ය වාර්තා ඇතුළු පෞද්ගලික රහස්‍ය බව ආරක්ෂා කිරීම්, වෙළෙඳ රහස් සහ රහසිගත වාණිජ තොරතුරු නීති වලංගු කිරීමේ පරීක්ෂණ, රහස්‍යභාවය හා ජාතික ආරක්ෂාව පදනම් කර ලබා ගත් තොරතුරු වැනි නිදහස් කළයුතු- ප්‍රභේදයන් මෙබඳු නීතියක් මඟින් ඇති කළ යුතු ය. තොරතුරු ලබාගැනීම හිතුවක්කාර ලෙස අවහිර කිරීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට ස්වාධීන අධිකාරියක් පත් කිරීමට නියමයන් සම්පාදනය කළ යුතුය. වෙනත් නීතිවල අඩංගු රහසිගතභාවය පිළිබඳ නියමයන් තොරතුරු නිදහස පිළිබඳ පනතට දෙවැනි විය යුතු ය.

2.3. 1973 පුවත්පත් මණ්ඩල නීතිය

කැබිනට් රැස්වීම්, තීරණ සහ ලියකිලයවිලි පුවත්පත්වල පළකිරීම තහනම් කරන, හිතුවක්කාර හා බාධාකාරී මෙන්ම සාධාරණීකරණය කළ නොහැකි 16 වන වගන්තිය කැබිනට් ඉදිරියේ ඇති කරුණු සහ කැබිනට් තීරණ පළකිරීමට ඉඩ සැලසෙන සේ වෙනස් විය යුතුය.

(ඉහත සඳහන් නිල රහස් පනත පිළිබඳ නිරීක්ෂණ අදාළ වන්නේ නිල රහස් සහ ආරක්ෂාවට අදාළ කරුණුවලට ය. මෙම පනත දේවාපහාසකාරී, අශිෂ්ට, හෝ අසභ්‍ය හෝ ප්‍රකාශනවලට අදාළ වන ආකාරය දේවාපහාසකාරි ප්‍රකාශන පිළිබඳ පනතෙහි පැහැදිලි වේ. 16 වන වගන්තිය සම්පූර්ණයෙන් අහෝසි විය යුතුය.

සාපරාධ අපහාස කිරීම් සම්බන්ධ ව 1973 පුවත්පත් මණ්ඩල පනතේ අන්තර්ගත 14 සහ 15 වන වගන්ති අහෝසි කළ යුතු ය. සාපරාධ අපහාස කිරීම් සඳහා යුක්තිය ඉටුකර ගැනීමට පුරවැසියාට ඇති හැකියාව ශක්තිමත් කළ යුතු ය.

2.4.1. පුවත්පත් මණ්ඩල පනත

1973 දී පැනවූ පුවත්පත් මණ්ඩල නීතිය වෙනුවට නව පුවත්පත් පනතක් පැනවිය යුතුය. ICCR හි ඇති අවශ්‍යාංගවලට අනුව මුද්‍රිත මාධ්‍යවල වගකිව යුතු බව හා නිදහස මේ පනතින් පැහැදිලි ව කියා පෑ යුතුය.

2.5 එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අයිතිය පුළුල් කිරීම

එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (විශේෂ සැලසුම්) පිළිබඳ නීතියෙහි ඉතා ම පැහැදිලි ව සඳහන් වන්නේ එම සමාගමෙහි පුළුල් අයිතිය පිළිබඳ මූලධර්ම මිස සමාගම රාජ්‍යය සතු කිරීම නො වේ. මෙම නෛතිකකරණයෙහි අභිප්‍රායයට අනුකූල ව ලේක් හවුස් ආයතනයේ අයිතිය පුළුල් කිරීමට පොදු පෙරමුණු ආණ්ඩුව ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පොරොන්දු විය. සිදත් ශ්‍රී නන්දලෝචන මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කළ කමිටුව මෙම අයිතිය පුළුල් කිරීමේ වැඩ පිලිවෙළ ක්‍රියාත්මක කිරීමට උපක්‍රමයක් ඉදිරිපත් කළේ ය. මෙයින් යෝජනා වන්නේ නන්දලෝචන කමිටුවේ යෝජනා අනුගමනය කිරීම හෝ නවීකරණය කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම.

## 3. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදවල්

3.1. අපහස පිළිබඳ ප්‍රමාණවත් ලෙස සිවිල් නීතියේ සඳහන් වී තිබෙන නිසා ජනරජයේ ජනාධිපතිට / පතිනියට අපහාස වන ලෙස "අවඥාත්මක, අපහාසකාරී හෝ හෙළා දැකීමේ හෝ (ලිඛිත හෝ අලිඛිත) හෝ වචන" භාවිතය වරදක් ලෙස දක්වන 118 වන වගන්තිය අහෝසි කළ යුතු වේ.

3.2. 19 වන ශතවර්ෂයේ නිර්මාණය කරන ලද ඉතා පුළුල් පරාසයක් සහිත රාජ ද්‍රෝහීත්වය පිළිබඳ 120 වන වගන්තිය අහෝසි කිරීම හෝ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් පිළිබඳ නීතියට අනුකූල වන ලෙස සංශෝධනය කිරීම හෝ කළ යුතු ය.

3.3. පසුගිය ආණ්ඩු විසින් භාවිත කරන ලද්දා වූද ඇමතිවරුන් විවේචනය කිරීම සහ විකල්ප දේශපාලන මත දැරීම අධෛර්යවත් කර්න්නා වූද මාධ්‍යයට එරෙහි සාපරාධ අපහාස පිළිබඳ වූ 479 වැනි වගන්තිය අහෝසි කළ යුතුය. මේ වෙනුවට විකාශන පනතෙහි සහ පුවත්පත් සමාගම් පනතෙහි ඇති අපහාස පිළිබඳ කාරණවල දී පුරවැසියනට යුක්තිය ඉටුකරගැනීමට ඇති නියමයන් ශක්තිමත් කළ යුතු ය. ජාත්‍යන්තර සම්මත වලට අනුකූල වන සේ ප්‍රතිචාර දැක්වීමේ අයිතිය ද මෙම පනත්වල අඩංගු විය යුතු ය.

## 4. අධිකරණය අපහාසයට ලක්කිරීම

හරයාත්මක හා කාර්ය පටිපාටිය නීතිය පැහැදිලි කිරීම පිණිස අධිකරණය අපහාසයට ලක් කිරීමට ඇති ඉඩකඩ ද 1981 එක්සත් රාජධානියේ අධිකරණය අපහාසයට ලක්කිරීමේ පනතෙහි කරුණු අනුව පුළුල් ව ව්‍යුහගත වූ සබ්-ජුඩිකේ නියමය ද නිශ්චිත ව අර්ථකථනය කරන අධිකරණය අපහාසයට ලක් කිරීම පිළිබඳ පනතක් පැනවිය යුතු ය. මෙහි වෙනත් කරුණු අතර තොරතුරු ලබාගත් මූලාශ්‍රයයන් හෙළි නොකිරීමට ඇති තත්ත්වයන්
ද තිබිය යුතුය.

## 5. ප්‍රකාශන තහනම් කිරීම

ව්‍යවස්ථානුකූල ව අවසර ලැබෙන හා තොරතුරු ලබාගැනීමේ ද අදහස් ප්‍රකාශ කිරීමේ
ද නිදහසට අනුකූල වන කරුණු වල දී හැර (වෙනත් අවස්ථා වල දී) මැදිහත් වීම් වැළැක්වීම් පිණිස ප්‍රකාශන තහනම් කිරීමේ හා ප්‍රකාශන ආනයනය මත බඳු තහංචි පැනවීමේ නීතිය පැහැදිලි කළ යුතු ය.

## 6. ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය

6 වන ව්‍යවස්ථා සංශෝධනයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අවහිර කරන්නා වූද දේශපාලනික වෙන්වීමක් වෙනුවෙන් සාමකාමී ව පෙනී සිටීම තහනම් කරන හා, එවැනි ක්‍රියාවන්ට එරෙහි ව තද දඬුවම් පනවන්නා වූද නියමයන් අහෝසි කළ යුතු ය.

## 7. හදිසි නීතිය

7.1. හදිසි නීතිය යටතේ වාරණ සහ වෙනත් සීමා කිරීම්

7.1.1. ICCPR විසින් භාවිතයට දෙනු ලැබ ඇති දළ සැකිල්ල ඇතුළත හැර අදහස් ප්‍රකාශ කිරීම පෙර-වාරණයට යටත් නොවිය යුතු අතර එවැනි අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමා කරන රෙගුලාසි ගැසට් ප්‍රකාශන ඔස්සේ ප්‍රසිද්ධ කළ යුතු අතර සෑම මාධ්‍යයක් ම ඔස්සේ භාෂා තුනෙන් ම ඉතා ඉක්මනින් ප්‍රකාශ විය යුතු ය. මෙම ප්‍රකාශන පළ වී සති දෙකක් ඇතුළත පාර්ලිමේන්තු යෝජනාවකින් සම්මත නොවුව හොත් එම රෙගුලාසි අහෝසි විය යුතු ය.

7.1.2 වාරණ ප්‍රතිපත්ති සැකසුම 1995 ඔක්තෝබර 1 වන දින ජාතික ආරක්‍ෂාව සහ අදහස් ප්‍රකාශ කිරීමේ සහ තොරතුරු පිළිබඳ නිදහසට අදාළ වූ ජොහැන්නස්බර්ග් මූලධර්ම වලින් මඟ පෙන්වීම්ක් ලැබිය යුතුය.

## 8. පුවත්පත් මුද්‍රණ කඩදාසිවල අධික මිළ

මුද්‍රණ කඩදාසි අපනයනය මත දැනට අයකෙරෙන ඉතා අධික වූ බදු නිසා පුවත්පත් මාධ්‍ය තුළින් අධ්‍යාපනය සහ තොරතුරු ලබාගැනීම පහළ ආදායම් ලබන ජනතාවට දුෂ්කර කාර්යයක් වේ. මෙම අපනයන බද්ද වඩා කාර්යක්ෂම වූ දැනුම බෙදා හැරීමේ සහ පැතිරීමේ කාර්යයට බාධාවක් වේ. එම නිසා මෙම ආනයන බද්ද අහෝසි කරන මෙන් යෝජනා කරමු.

## 9. පොදු විකාශන සේවා

9.1. ශ්‍රී ලංකාවේ රජයෙන් අරමුදල් සැපැයෙන හා පාලනය කැරෙන සියලු විකාශන සේවා ජනසතු කළ යුතු අතර සියලු ම ආකාරයෙන් රාජ්‍ය පාලනයෙන් තොර විය යුතු ය.

9.2. මහජන විකාශනයේ අගයන් ආරක්‍ෂාව ස්ථිර කිරීම අරබයා විකාශන අධිකාරියේ පාලක පක්ෂය සම නියෝජනයකින් ද ස්වාධීන තත්ත්වයෙකින් ද සමන්විත විය යුතුය.

## 10. විද්‍යුත් මාධ්‍ය

10.1. ස්වාධීන විකාශන අධිකාරියක්

රාජ්‍ය පාලනයෙන් හෝ රාජ්‍ය නොවන ආයතනවල කවර ආකාරයේ බලපෑමකින් හෝ සැබවින් ම තොර විකාශන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්‍ෂණික අංග ඇතුළත් වූද ප්‍රජා ගුවන් විදුලිය, මහජන සහ පෞද්ගලික විකාශන ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමට බලය ඇත්තා වූද ස්වාධීන විකාශන අධිකාරියක් පැවැත්විය යුතු ය. මේ සඳහා නීති සම්පාදනයේ දී මහජන අභිලාෂය පිළිබඳ මතවාද හා තොරතුරු ලබාගැනීමේ මහජන අයිතිය ද විකල්ප අදහස් පිළිබඳ සුනිසි සමබර බවක් පවත්වා ගැනීමේ මූලධර්මය ද විශේෂයෙන් සඳහන් විය යුතු ය. මෙම විකාශන අධිකාරි මඩුල්ලට සාමාජිකයන් තෝරා ගැනීමේ දී කිසියම් දේශපාලන සමූහයක ආධිපත්‍යයකින් තොර වන බවට සහතික විය යුතු ය.

10.2. ප්‍රජා ගුවන් විදුලිය සහ රූපවාහිනිය

ප්‍රජා ගුවන් විදුලිය හා ගුවන් විදුලි සේවාවන් වැඩි දියුණු කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් නීතිගත

කළ යුතු වේ. මෙම සේවාවලින් විකාශනය වන වැඩ සටහන්වලින් අඩු ම ගණනේ 50% ක් වත් මේ පිළිබඳ ව ප්‍රකාශ කරන ලද අරමුණුවලට අනුකූල වන බව විධිමත් වූ අධිකාරියක් විසින් තහවුරු කළ යුතු වේ.

## 11. ප්‍රවෘත්ති මූලාශ්‍රයයන් ආරක්ෂා කිරීම

ප්‍රවෘත්ති මූලාශ්‍රවල රහසිගතභාවය ආරක්ෂා කිරිම සඳහා නීති හඳුන්වා දිය යුතුය.

## 12. නීති සම්පාදනය පිළිබඳ විචාරය

ජාත්‍යන්තර මට්ටමින් පිළිගත් පවතින මිනුම් දඬුවලට අනුකූල ව නීති විචාරය සහ සංශෝධනය කිරීම සිදුවිය යුතු ය. විශේෂයෙන් ම 1927 නොසරුප් ප්‍රකාශන පිළිබඳ නීතිය, 1912 ප්‍රසිද්ධ රැ ගුම් පිළිබඳ රාජ්‍ය ආඥාව, ප්‍රසිද්ධි රැගුම් පාලක මණ්ඩල පනත සහ 1957 දේවාපහාසකාරී ප්‍රකාශන පිළිබඳ පනත විචාර කළ යුතු ව ඇත. පළ වී සති දෙකක් ඇතුළත පාර්ලිමේන්තු යෝජනාවකින් සම්මත නොවුව හොත් එම රෙගුලාසි අහෝසි විය යුතු ය.

## 13. මාධ්‍ය ආයතනවල සහ එම කාර්ය මණ්ඩලවල වගකීම් - ස්වෙච්ඡා ආචාර ධර්ම පද්ධතිය

1. සියලු මාධ්‍ය ආයතන සහ එම කාර්ය මණ්ඩල පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත ආචර ධර්ම පද්ධතියක් පිළිපැදිය යුතු ය.

   අ) ප්‍රවෘත්ති නිවැරදි ලෙසත්, විෂය මූලික වන ලෙසත් වාර්තා කිරීමට මාධ්‍ය ආයතන බැඳී සිටිය යුතු ය.

   ආ) චේතනාත්මක ව හෝ නොසැලකිල්ල නිසා හෝ යථා කරුණුවලින් දුරස්ථ වීමකින් තොරව නිවැරදි සන්දර්භයකින් යුතු ව සහ සමබර ලෙස ප්‍රවෘත්ති ඉදිරිපත් කළ යුතු ය.

   ඇ) ප්‍රවෘත්ති මූලාශ්‍රය සැලකිල්ලට ගත් කල සත්‍යය යැයි බොහෝ දුරට ම හැඳින්විය හැකි දේ පමණක් යථා කරුණු ලෙස ඉදිරිපත් කළ යුතු වේ. යථා කරුණු මත පදනම් නොවූ මතයක්, විශ්වාස මාත්‍රයක් හෝ ඔප්පු කිරීමට තිබෙන චෝදනාවක් මත පදනම් වූ වාර්තාවක් භාවිත කරන්නේ නම් ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතු ය.

   ඈ) යම් වාර්තාවක නිරවද්‍ය බව සැක කිරීමට හේතුවක් ඇත්නම් සහ එම නිරවද්‍ය බව සත්‍යෙක්ෂණය කිරීම සිදු කළ හැකි නම්, එය නැවත සත්‍යෙක්ෂණය කළ යුතු ය. එවැනි සත්‍යෙක්ෂණයක් සිදු කළ නොහැකි අවස්ථාවල දී ඒ බව පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

   ඉ) විකාශනය කරන ලද වාර්තාවක් සාවද්‍ය බව පසු ව පෙනී ගියහොත් එය අවිනිශ්චිතාවකින් හෝ ප්‍රමාද වීමකින් තොරව නිවැරදි කළ යුතු ය. මෙම නිවැරදි කිරිමට ප්‍රමාණවත් හා සාධාරණ ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු අතර, එය උචිත කාලයක් තුළ සහ පහසුවෙන් අවධාරනයට ලක් වන ආකාරයට ඉදිරිපත් කල යුතු ය.

ඊ) පුද්ගලයන් සහ / හෝ මාධ්‍ය ආයතන අතර පවතින හා පැවතිය හැකි බැඳියා පිළිගැටුම් අනාවරණය විය යුතුය.

උ) ප්‍රවෘත්ති හා විස්තර විකාශනයේ දී මාධ්‍යයන් ජාතිවාදය හා ලිංග භේදය පිළිබඳ ව සැලකීමෙන් තොර විය යුතු ය.

ඌ) මාධ්‍ය වලින් සමාජ යථාර්ථය ඉදිරිපත් කිරීමේ දී මෙහි අන්තර්ගත නානාවිධත්වය, බහුවිධතාව සහ සංකීර්ණතාව සැලැකිල්ලට ගතයුතු අතර ස්ත්‍රීන්ගේ, සුළු ජාතීන්ගේ සහ පීඩිත සමූහයන්ගේ අපේක්ෂා පිළිබඳ ව සංවේදී විය යුතු ය.

එ) ළමයින් ප්‍රේක්ෂකයන් අතර සිටීමේ හැකියාව තිබෙන අවස්ථාවල මාධ්‍යයන් නිසි අවධානයෙන් හා වගකිව යුතු අන්දමින් ක්‍රියාකළ යුතු ය.

ඒ) කෲර ක්‍රියා, සාහසික ක්‍රියා, දාමරික ක්‍රියා, මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතය සහ අසභ්‍ය ක්‍රියා නිරූපණය කරන හෝ මෙවැනි ක්‍රියාවන්ට සම්බන්ධ වන හෝ අවස්ථා හෝ සංවේදිතාවකින් හෝ තොර ව ඉදිරිපත් නො කළ යුතු ය.

ඔ) මාධ්‍ය නිදහස, සමාජ වගකීම හා කර්තෘ මණ්ඩල නිදහස මූල්‍යමය ලාභ ලබාගැනීමේ චේතනාවලට යටත් නොවිය යුතු ය.

ඕ) සමාන සහභාගිකයන් වශයෙන් අන්‍යෝන්‍ය වගකීමකින් යුතු ව එකට කිරීම සඳහා විවිධ අංශවල මාධ්‍යයන් අතර එකඟතාවක් තිබිය යුතු ය.

## 2. පෞද්ගලික රහස්‍යභාවය

නීත්‍යනුකූල මහජන අවශ්‍යතා පෞද්ගලික රහස්‍යතාවයට ඇති අයිතියන ඉක්මවා යා හැකි බව මතක තබාගනිමින්, පෞද්ගලික ජීවිත සහ පෞද්ගලික කාරණ සම්බන්ධ ප්‍රවෘත්ති සහ විග්‍රහයන් ප්‍රකාශනය කිරීමේ දී මාධ්‍යයන් අතිශ්‍ය සැලකිල්ලක් ද වැඩි අවධානයක් ද සහිත ව ක්‍රියා කළ යුතු වේ.

## 3. ප්‍රතිචාර දැක්වීමේ අයිතිය

පුද්ගලයන්ගේ කීර්තියට, ගෞරවයට, නම්බුවට, හැඟීම්වලට සහ පෞද්ගලිකත්වයට හානිකර සාවද්‍ය ප්‍රකාශනවලින් එම පුද්ගලයන් ආරක්ෂා කිරීම තකා සහ අදහස් ප්‍රකාශ කිරීමේ දී තොරතුරු පිළිබඳ සහ ප්‍රකාශන පිළිබඳ අයිතීන් ක්‍රියාත්මක කිරීමේ වගකීම් ධෛර්යමත් කිරීම සඳහා ප්‍රතිචාර දැක්වීමේ අයිතිය තහවුරු කරන නියමයන් පැනවිය යුතු ය. මෙම ප්‍රතිචාරය එම අතෘප්ත පක්ෂය නිරවද්‍ය කරුණු ලෙස දක්වන ප්‍රකාශයට සීමා විය යුතු අතර එම කියා පෑ සාවද්‍ය භාවය හෝ තොරතුරු විකෘති කිරීම හෝ නිවරද්‍ය කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා දීර්ඝ නොවිය යුතු ය.

තනි ආයතනවලට මාධ්‍ය ප්‍රතිසංස්කරණය තකා මෙහි අඩංගු නියමයන් ඉක්මවා ක්‍රියා කිරීමට මෙම ඒකමතික භාවයෙන් කිසිදු අවහිරයක් නො වේ.

## සමාප්තිය

විවිධ මාධ්‍ය ආයතන අතර විශිෂ්ට අන්දමේ සහභාගිත්වයක් විදහා පාමින් ශ්‍රී ලංකා වෘත්තීය ප්‍රවෘත්තිපත්‍ර කලාවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය, පුවත්පත් කතුවරුන්ගේ සංසදය, ලෝක පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ වූ සමුළුව සංවිධානය කිරීම සම්බන්ධයෙන් අපගේ කෘතඥතාව පළ කරමු.

පොදුවේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසත් විශේෂයෙන් මාද්‍ය නිදහසත් නංවාලීම උදෙසා අපගේ ඇති බැඳීමත් සහයෝගීතාවත් සමගියත් තහවුරු කරමු. මෙම කාර්යය ඉටු කර ගැනීම සඳහා තම තමන් අතර ඇති මතයන් ගේ වෙනස් බව සහ විවිධ ක්‍රමවේදවලට මූලිකත්වයක් නොදී සමගියෙන් ක්‍රියා කරන මෙන් අප මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

ශ්‍රී ලංකා පුවත්පත් ප්‍රකාශකයින්ගේ සංගමය

පුවත්පත් කතෘන්ගේ සංසදය

ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය මෙම ප්‍රකාශයේ මූලධර්ම අනුමත කර ඇති නමුත් එම සංවිධානයේ අධ්‍යක්ෂක කමිටුවේ අනුමැතිය ලැබෙන්න තෙක් මෙම ප්‍රකාශය අත්සන් තැබීම කල්දමා ඇත.